(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 73.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 පෙබරවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0044/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ආනයනය කරන ලද හා දේශීයව නිෂ්පාදනය කරන ලද සහල්, සීනි, තිරිඟු පිටි, පරිප්පු, කිරිපිටි, ලූනු හා මිරිස් ආදී භාණ්ඩ මුළු ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත භාණ්ඩ මත පනවා ඇති තීරුබදු, වැට් බදු හා නිෂ්පාදන බදු ප්‍රමාණයන් කවරේද;

(iii) ඉහත (ii) ට අනුව තීරුබදු හා බදු මගින් උපයාගත් මුළු ආදායම කොපමණද;

යන්න පසුගිය වර්ෂ 5ට අදාළව, වෙන් වෙන් වශයෙන්, එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0534/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, අක්කරපත්තු - සකාමම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0621/'10

3.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2008/41 මගින් පාසල් ආදි ශිෂ්‍ය සංගම් හා වෙනත් විවිධ සංගම් මගින් පාසල් සිසුන්ගෙන් සහ දෙමාපියන්ගෙන් යම් යම් හේතු දක්වා මුදල් එකතු කිරීම තහනම් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ තිබියදී කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය 2010 රෝයල් පැරේඩ් (Royal Parade) නමින් රු. 600 ක් වටිනා කොටු කාඩ්පත් ළමුන් අතර බෙදා එමගින් මුදල් එකතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත චක්‍රලේඛයට පටහැනිව මුදල් එකතු කර තිබේ නම්, ඒ වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0625/'10

4.

ගරු අශෝක් අබේසිංහ මහතා,— තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) නව නිර්මාණකරුවන් විසින් තමන්ට සිදුවන අසාධාරණකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නව නිමැයුම්කරුවන්ගේ කොමිසම වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති පැමිණිලි පිළිබඳව එතුමිය දන්නෙහිද?

(ආ) (i) නව නිර්මාණකරුවන් වන ව්‍යාපාරික සෙනෙවිරත්න, කථිකාචාර්ය රිචඩ් නිකපිටිය සහ කේ. ඩී. පෙරේරා යන අය විසින් ඔවුන්ගේ නිර්මාණ වංචාකර ඇති බවට කරනු ලබන ප්‍රකාශ සම්බන්ධව ගෙන ඇති පියවර කවරේද;

(ii) නව නිර්මාණකරුවන් විසින් නව නිමැවුම්කරුවන්ගේ කොමිසමේ සභාපති සහ එහි සමහර නිලධාරීන් සම්බන්ධව කර ඇති ලිඛිත පැමිණිලි පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර තිබේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිමැවුම්කරුවන්ගේ කොමිසමේ සභාපතිගේ අත්තනෝමතික ක්‍රියාවන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස නිර්මාණ මංකොල්ලයට හසුවී සිටින නිර්මාණකරුවෝ ජනාධිපතිතුමාගෙන් ලිඛිතව ඉල්ලා ඇති බවත්;

(ii) එම කොමිසමට වර්ෂයක් සඳහා රජය ලබාදුන් ප්‍රතිපාදන සුළු කාලයක් තුළ වියදම් කර ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් කොමිසමේ විගණන වාර්තා එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0628/'10

5.

ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින කෘෂිකර්ම උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) කෘෂිකර්ම උපදේශක ශ්‍රේණි හා ඊට අදාළ ශ්‍රේණි සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් අනුව සිටිය යුතු කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද ;

(ii) ඌව පළාත් සභාවට බඳවාගත් කෘෂිකර්ම උපදේශකවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) කෘෂිකර්ම උපදේශක පුහුණු හා කෘෂිකර්ම ඩිප්ලෝමාවේදීන් අතර සමානත්වයක් පවතින්නේද;

(iv) කෘෂිකර්ම උපදේශක පුහුණු ශ්‍රේණිය සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(v) කෘෂිකර්ම ඩිප්ලෝමාවේදීන්, කෘෂිකර්ම උපදේශක තනතුරට බඳවා ගැනීම සඳහා ක්‍රියා පටිපාටියක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0861/'10

6.

ගරු අජිත් කුමාර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල - මාතර දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන වැඩකටයුතු කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදෙන රට හෝ ආයතනය කවරේද;

(iv) ලබාදෙන එම මූල්‍ය ප්‍රතිපාදනය ණයක්ද නැතහොත් ආධාරයක්ද;

(v) එය ණයක් නම්, ඊට අදාළ පොලිය, ආපසු ගෙවිය යුතු කාල සීමාව හා කොන්දේසි කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන්;

(i) අත්සන් කළ ගිවිසුම් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(ii) නිමකිරීම සඳහා භාරදුන් කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(iii) උපදේශකයින් ලෙස කටයුතු කරන්නේ කවුරුන්ද;

(iv) අධීක්ෂණය කරනු ලබන ආයතනය කවරක්ද;

(v) නිම කිරීමට අපේක්ෂිත කාලය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතියේ උප කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, ලිපිනයන් හා ඔවුන්ට පැවරී ඇති උප කොන්ත්‍රාත්තුවේ ස්වභාවයන් හා එහි වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ ඉන්දියාවේ හෝ වෙනත් රටක කම්කරුවන් සේවයේ යෙදී සිටින්නේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'10

7.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සම්පූර්ණ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ආ) එම එක් එක් වර්ෂයේදී,

(i) දේශන ගාස්තු වශයෙන් අයකර ගන්නා ලද මුදල;

(ii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්පත් ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iii) එම විභාගයේ විභාග ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iv) වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ලැබුණු ආදායම;

(v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා ඇති පරිදි දේශන ගාස්තු වැඩිකිරීමකින් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යෑමට නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම්, ඒ මන්ද?

0432/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටක උද්ධමනය ගණනය කිරීමට බලය ලත් ආයතන කවරේද;

(ii) පසුගිය වර්ෂ 15ක කාලය තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය කොපමණද;

(iii) එක් එක් වර්ෂයේදී උද්ධමනය නිසා සිදුවන අගය අඩුවීම ගණන් බැලීමෙන් 1995 වර්ෂයේ රු.1000.00 ක අද වන විට මුදලේ තථ්‍ය වටිනාකම (1995 උපයන ලද රු. 1000.00 ක අද දින ක්‍රය ශක්තිය) කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ ආර්ථිකය වගකීමෙන් තොරව මෙහෙයවීම වෙනුවෙන් වගකිවයුතු පුද්ගලයින්ගේ නම් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉන්දියාව, පාකිස්ථානය, මාලදිවයින, භූතානය, නේපාලය, සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල උද්ධමනය පසුගිය වර්ෂ 5 සඳහා කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0536/'10

9\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, පොතුවිල් - පානම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මඟින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0874/'10

10\.
ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලංකාව ඉරානයෙන් ලබා ගත් ණය ප්‍රමාණයන් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත වර්ෂවලදී ඉරානය, ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ආසියානු සංවර්ධන අරමුදල යන ආයතනවලින් ලබා ගත් ණය මුදල් යෙදවූ ව්‍යාපෘති කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘති සඳහා යෙදවූ මුදල් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ණය මුදල්වලින් ව්‍යාපෘති සඳහා නොයෙදවූ දැනට භාණ්ඩාගාරය සතුව ඇති ප්‍රමාණය කොපමණද;

(v) ඉහත (ii) හි සඳහන් එක් එක් ආයතනයට හෝ රටට ගෙවීමට ඇති ණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම ණය ප්‍රමාණයන් ගෙවීමට දී ඇති කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0881/'10

11.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින,

(i) රජයේ අධිනීතිඥවරුන්ගේ සංඛ්‍යාව;

(ii) රජයේ නීතිඥවරුන්ගේ සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීම් ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍යකරන රජයේ අධිනීතිඥවරුන්ගේ සංඛ්‍යාව සහ රජයේ නීතිඥවරුන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0540/'10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය - තිරික්කොණ්ඩියාඩුමඩු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක් ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්;

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0599/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉදිරි වර්ෂ 3 සඳහා,

(i) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම වෙනුවෙන් සකස් කරන ලද ඉදිරි තරඟවාර පිළිබඳ වැඩසටහන කවරේද;

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම සංචාරය කිරීමට නියමිත රටවල් සහ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිත රටවල නම් කවරේද;

(iii) ක්‍රීඩා කිරීමට නියමිත ටෙස්ට් තරඟ සංඛ්‍යාව සහ එක්දින තරඟ සංඛ්‍යාව කවරේද;

(iv) අපේක්ෂිත ආදායම සහ දැරීමට සිදුවන වියදම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනයේ සමස්ත මාසික වියදම කවරේද;

(ii) "ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනයේ සේවය කරන පුද්ගලයන්ගේ නම් ලැයිස්තුව සහ මසකට රු. 50,000/=ට වැඩි පාරිශ්‍රමිකයක් හෝ වැටුපක් ලබන පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) "ශ්‍රී ලංකා ක්‍රිකට්" ආයතනයේ මාසික පොදු කාර්යය පිරිවැය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ශෝක ප්‍රකාශ යෝජනා

1.

අභාවප්‍රාප්ත ගරු පී. චන්ද්‍රසේකරන් මහතා, හිටපු අමාත්‍ය සහ පාර්ලිමේන්තු මන්ත්‍රී

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන),— 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2011 පෙබරවාරි මස 23 වැනි බදාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

4.

ගරු කමලා රණතුංග මෙනෙවිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"භේදන් අධ්‍යාපන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු හුනෛයිස් ෆාරූක් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රණ කලා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*2.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*4.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

5.

මහේෂ්වරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

6.

ශ්‍රී ලංකාවේ සැමට සෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

7.

පින සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---